# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.23 පැය 1710 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 819 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**"සිරි දළදා වන්දනාව" වෙනුවෙන් බැතිමතුන්ගේ පැමිණීම වැඩිවීම හේතුවෙන් ඉදිරි දෙදින තුල වන්දනාමාන කටයුතු සිදු කිරීම සඳහා පැමිණීමෙන් වළකින ලෙස ඉල්ලා සිටීම - පොලිස් මූලස්ථානය.**

"සිරි දළදා වන්දනාව" 2025.04.18 වන දින ආරම්භ කර 2025.04.23 වන අද දින පස්වන දිනටත් පැවැත්වේ. සිරි දළදා වන්දනාව පැවැත්වෙන අද දින මේ වන විටත් බැතිමතුන් ලක්ෂ තුනකට අධික සංඛ්‍යාවක් සිරි දළදා වන්දනාව සඳහා මහනුවර නගරයේ පෝලිම් වලට ඒකරාශීවී සිටිති. එබැවින් 2025.04.24 වන හෙට දින සහ 2025.04.25 යන දෙදින තුළ "සිරි දළදා වන්දනාව" සිදු කර ගැනීම සඳහා ප්‍රමාණවත් බැතිමතුන් පිරිසක් දැනටමත් පැමිණ සිටින බැවින් ඉදිරි දෙදින තුළ තවත් බැතිමතුන් පැමිණීමක් සිදුවුවහොත් අලුතින් පැමිණෙන බැතිමතුන් හට වන්දනාමාන කටයුතු සිදු කර ගැනීම සඳහා අවස්ථාව නොලැබී යා හැකිය.

එබැවින් ඉදිරි දෙදින තුළ "සිරි දළදා වන්දනාව" සඳහා පැමිණීමෙන් වලකින ලෙසට බැතිමතුන්ගෙන් ශ්‍රී ලංකා පොලිසිය කාරුණිකව ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**